**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - 2019**
**-----------------------------------------**

## 1.1 මතය

**-------**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත් 107(5) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

**------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනිමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීමවල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් " මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදීයට අනුකූල නොවීම**

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7.6 වගන්තිය | 1989 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගත වූ නිලධාරීන් 36 දෙනෙකු ආපසු සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් බැඳුම්කර කඩවීම මත අයකර ගත යුතු රු. 67,132,548 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | 1989 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා බැඳුම්කර කඩකල නිළධාරීන් අතරින් තිදෙනෙකුගෙන් අයවිය යුතු මුදල් අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමටත්, ඉතිරි 11 දෙනා සම්බන්ධයෙන් නඩු පැවරීමටත් කටයුතු කර ඇත. නඩු පැවරූ 8 දෙනෙකු ලිපිනයන් හැර ගොස් ඇති බැවින් ඉදිරි කටයුතු කිරීමට නොහැකි වී ඇත. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 528,714,822 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 352,552,779 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 176,162,043 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අධ්‍යයන සේවා වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 අනුපාත විශ්ලේෂණය

- ලාභදායී අනුපාතය

සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 528,714,822 ක් ද, මුළු ආදායම රු. 3,224,090,058 ක් ද, වුයෙන් ලාභදායී අනුපාතය සියයට 16.4 ක සෘණ අගයක් වු අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය සියයට 13.8 ක සෘණ අගයක් ගෙන තිබුණි.

- ජංගම අනුපාතය

සමාලෝචිත වර්ෂයේ මුළු ජංගම වත්කම් රු. 826,651,804 ක් ද, ජංගම වගකීම් රු. 654,608,749 ක් ද වුයෙන් ජංගම අනුපාතය 1.26:1 ක් වු අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය 0.9 :1 ක් වශයෙන් පැවති බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1992 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල විවිධ හේතූන් මත සේවයෙන් ඉවත් වූ නිළධාරින් 25 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 1,186,370 ක් අයකර ගැනිම සඳහා 2020 මැයි වන විටත් කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයෙන් ඉවත් වී ඇති සේවකයන්ගෙන් අයවීමට ඇති ණය ශේෂයන් ඔවුන්ගේ අර්ථසාධක අරමුදල නිදහස් කිරීමේදී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | සේවයෙන් ඉවත් වී ඇති නිලධාරීන්ගෙන් අයකරගත යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරනු ලබන ප්‍රාදේශීය මධ්‍යස්ථාන හා අධ්‍යයන මධ්‍යස්ථාන 18 ක සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 576,890,180 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබුණද, එම ඉදිකිරීම් කළ ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය විශ්වවිද්‍යාලයට ලබා ගැනීම සඳහා 2020 ජුනි වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව ගාස්තුවකින් තොරව අදාල ඉඩම් පවරා ගැනීමට ඉල්ලීම් සිදු කර ඇත. එසේම මෙම ගැටළුව අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට ද යොමු කරන ලදි. | අදාළ ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට අනුමත අධ්‍යයන කාර්යමණ්ඩලයෙහි පුරප්පාඩු 119 ක් පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම වෙනුවෙන් රු. 48,682,049 ක් වැයකර තිබුණි. | විවිධ ගැටළු හේතුවෙන් පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීම් මාස කිහිපයක් ප්‍රමාද වුවද මේ වන විට කථිකාචාර්ය තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරමින් පවතී. තාවකාලික අධ්‍යයන තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකලද නැවත ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ. අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල තනතුරු " දරන්නාට පෞද්ගලික වන සේ " කාර්ය මණ්ඩල වාර්තාවේ සඳහන් බැවින් එම තනතුරු පුරප්පාඩු වූ විට නැවත බඳවා ගැනීම් සිදුකළ නොහැකිය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට පරිපාලන, මූල්‍ය හා විධායක නිලධාරීන් තනතුරු 27 ක් හා අනෙකුත් අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 123 ක් වශයෙන් පුරප්පාඩු 150 ක් පැවති අතර සමාලෝචිත වර්ෂය තුළදී නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා වශයෙන් රු. 50,235,891 ක් ගෙවා තිබුණි. | මූල්‍ය හා විධායක නිලධාරී තනතුරු පුරප්පාඩු වලින් තනතුරු 4 කට බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. සහකාර ලේඛකාධිකාරී තනතුරට බඳවා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සිදුකරනු ලැබේ. රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතු අනධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කාලයක් ගත වේ. බොහෝ පුරප්පාඩු පිරවීමේදී බඳවා ගැනීමේ පරිපාටි අනුව පළමුව අභ්‍යන්තරව බඳවා ගැනීමේ දී වෙනත් තනතුරක පුරප්පාඩු ඇතිවේ. එමෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ බොහෝ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නාම ලේඛන පදනම් කර ගත යුතු වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව 2019.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය වීම හේතුවෙන් අතිකාල දීමනා වැඩිවීමට හේතු වී ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත වියදම්, තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී පුනරාවර්තන වියදම් විෂයයන් 4 ක සියයට 31 සිට සියයට 73 ක් සහ ප්‍රාග්ධන වියදම් විෂයයක සියයට 66 ක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | 2019 වර්ෂය තුල පැවති අනධ්‍යයන සේවක වැඩ වර්ජනයත්, පාස්කු දින ප්‍රහාරයත් හේතුවෙන් 2019 වර්ෂය සඳහා සැලසුම් කල අධ්‍යයන/අනධ්‍යයන කටයුතු සැලසුම් කල අයුරින් ඉටුකර ගැනීමට නොහැකි වීම පිරිවැයට වඩා තත්‍ය වියදම අඩු අගයක් ගැනීමට ප්‍රධාන වශයෙන් හේතු විය. | ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනය යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |